# මාළු වෙළඳක්‍රමය හා එය තුළ වෙළඳුන් විසින් වැඩි වාසින් අත්කර ගැනීම සඳහා යොද ඇති උපාය මාර්ගයන් පිළිබඳව මිරිදිය ධීවර කර්මාන්තය ආශ්‍රයෙන් කෙරෙන විග්‍රහයක්.

ජේ. කේ. එම්. ඩී. චන්ද්‍රසිරි

ශ්‍රී ලංකාව තුළ අක්කර 7,04,000 තරම් විශාල ප්‍රදේශයක් පුරා විසිරී පවත්නා අභ්‍යන්තර ජලාශ විශාල ප්‍රමාණයක් තිබෙන බැවින් මිරිදිය ධීවර කර්මාන්තය දියුණුකිරීම සඳහා වඩාත් හිතකර වූ වාතාවරණයක් පවතී. කාලයක් මුළුල්ලේ මෙම ජල සම්පත් ඒ සඳහා උපරිම ලෙස යොද නොගත්තත් මෑතක දී රජය විසින් ධීවර කර්මාන්තය දියුණුකිරීම සඳහා ක්‍රියාත්මක කළ ධීවර මහා සැලැස්ම (1979–83) යටතේ මේ අංශය වෙත ද වැඩි අවධානයක් යොමු කරනු ලැබූ බැවින් පසුගිය වසර කීපය තුළ මිරිදිය ධීවර කර්මාන්තයේ සැහෙන ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. ඒ අනුව 1978 දී මෙ ටොන් 16,400 වූ මිරිදිය මාළු නිෂ්පාදනය 1983 අවසාන වන විට මෙ.ටොන් 35,500 දක්වා ඉහළ ගිය අතර එය මුළු දේශීය මාළු නිෂ්පාදිතයෙන් 16.2% පමණ විය.

මෙසේ පසුගිය කාලය තුළදී මිරිදිය ධීවර කර්මාන්තයේ සැහෙන ප්‍රගතියක් තිබුන ද එය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීමේ දී මුහුණපෑමට සිදුවන ගැටළු කීපයක් දක්නට තිබේ. මාළු වෙළඳාම හා සම්බන්ධ ගැටළු ඉන් ඉතා වැදගත් ඒවා සේ සැලකිය හැක. මෙම ලිපියෙන් මිරිදිය ධීවරයින්ට මාළු විකිණීමේ දී අත්දකීමට සිදුවන එවැනි ගැටළු මෙන්ම මසුන් වෙළඳාමේ සංවිධානාත්මක ව්‍යුහය තුළ ධීවරයින් හා වෙළඳුන්ට අත්වනු ලබන වාසි අවාසි සහගත තත්ත්වය ද විමසා බැලීමට අදහස් කෙරේ. මෙම සාකච්ඡාවට පසුබිම් වන්නේ හම්බන්තොට, දිස්ත්‍රික්ක යේ පිහිටි ප්‍රධාන ජලාශයන් කීපයක් වන රිදියගම, බඳගිරිය, වීරවිල, තිස්ස හා යෝධවැව යන ඒවා ය. මෙහි ඇතුළත් වන තොරතුරු 1985 ජනවාරි මාසය තුළදී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් මිරිදිය ධීවර කර්මාන්තය පිළිබඳව එම ජලාශ ආශ්‍රයෙන් කරන ලද පර්යේෂණයකින් සොයාගනු ලැබූ ඒවා වෙයි.

මිරිදිය මාළු සම්බන්ධයෙන් සලකා බලන විට ඒ සඳහා එතරම් හොඳ වෙළඳපොලක් තිබේ යැයි සෑහීමකට පත්විය නොහැක. ලක්වැසි ජනතාව වඩාත් ප්‍රියකරන්නේ කරදිය මාළු බැවින් මිරිදිය මාළු සඳහා අඩු ඉල්ලුමක් ද එනිසාම ඇති වූ අඩුමිලක් ද වේ. (People's Bank, Aug. 77) එහෙත් වෙරළ බඩ ප්‍රදේශවලින් ඈත් වී රට අභ්‍යන්තරයට යත්ම කරදිය මාළු හිඟකම මත මිරිදිය මාළු සඳහා සතුටුදායක ඉල්ලුමක් පවතී. පිහිටීම අතින් බලන විට අප අධ්‍යයනය සඳහා තෝරාගත් ජලාශ මුහුදු වෙරළේ සිට සුළු වශයෙන් එකිනෙකට වෙනස් දුර ප්‍රමාණයන් තුළ පිහිටා ඇතත් රට අභ්‍යන්තරයට වෙරළේ සිට සැතපුම් 5 පමණ වන සාමාන්‍ය දුරක් සහිතව පිහිටා ඇති බව පෙනේ. මෙසේ තෝරාගත් ප්‍රදේශය මුහුදු වෙරළට තරමක් කිට්ටු නිසාත් ආසන්න ප්‍රදේශයන්හි කරදිය මාළු බහුලව ඇති නිසාත් අධ්‍යයන ප්‍රදේශය තුළ මිරිදිය මාළු සඳහා එතරම් හොඳ ඉල්ලුමක් නොපැවතුනි.

අධ්‍යයනයට ලක් වූ ජලාශයන්හි ප්‍රධාන වශයෙන්ම ඉහළ ආර්ථික මට්ටමකින් ධීවර කර්මාන්තයෙහි යෙදෙන්නේ ඒ ඒ ජලාශයන් යටතේ පිහිටුවා තිබෙන ධීවර ව්‍යාප්ති සේවා සමිතිවල සාමාජිකයන් බවට පත් වූ සංවිධානමය වූ ව්‍යුහයක් යටතේ කටයුතු කරන ධීවරයන්ය.

මේ අයට සහනාධාර යටතේ ෆයිබර් ඔරු හා දැල් රජයෙන් ලබා දී ඇත. කර්මාන්තයේ නියුතු සංඛ්‍යාව ජලාශයට බෙද දී ඇති ඔරු සංඛ්‍යාව අනුව ජලාශයෙන් ජලාශයට වෙනස් වේ. බෙද දී ඇති සෑම ඔරුවක් සඳහාම මෙවැනි ධීවරයෝ දෙදෙනෙක් සිටිති.

. 1 වෙනි සටහන

එකිනෙක ජලාශයක් වෙත නිකුත් කර ඇති ඔරු සංඛ්‍යාව

| රිදියගම | | බඳගිරිය | | වීරවිල | | තිස්ස | | යෝධවැව | | සියළුම ජලාශ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 42 | ... | 43 | ... | 14 | ... | 24 | ... | 31 | ... | 154 |

මූලාශ්‍රය : මුරුතවෙල මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය

මෙම ධීවරයින්ගෙන් බොහොමයක් ජලාශයන් වටා පිහිටි රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචිවූවන් වන අතර ඔවුහු ඒවායේ සාදගත් අස්ථිර නිවාසවල (මැටිබිත්ති, පොල්අතු වහල හා මැටි හෝ ගොම ගෑ බිම සහිත) ජීවත් වෙති. රිදියගම හා බඳගිරිය ජලාශයන්හි මෙම ධීවර යින් ගෙන් වැඩි ප්‍රමාණයක් එම ජනපද වැසියන්ගේ දෙවැනි පරම්පරාවට අයත් අය වන අතර ඔවුහු රැකියා නොමැති කම නිසා ජලාශ ඉඩම්වල අනවසරයෙන් පදිංචිව ධීවර කර්මාන්තයේ යෙදුන අය වෙති.

අධ්‍යයන නියැදිය සමස්ථයක් වශයෙන් ගත්කළ සියයට හැත්තෑ අටකගේම ප්‍රධාන රැකියාව ධීවර කර්මාන්තය වන අතර, ඇතැම්හු ද්විතීය ආදායම් මාර්ගයක් වශයෙන් හේන් ගොවිතැන හා ශ්‍රමිකයන් ලෙස ද සේවා නියුක්තව සිටිති. එසේ වුවත් ඔවුන්ගේ ආදායමින් සියයට හැත්තෑ තුනක් පමණ ධීවර කර්මාන්තය තුළින් ලැබෙන නිසා වෙනත් කටයුතුවලට වඩා ධීවර කර්මාන්තය ඔවුන්ගේ ආර්ථික පැවැත්ම කෙරෙහි තීරණාත්මක ලෙස බලපෑනු ලබයි. ජලාශ යන් වෙන් වෙන්ව ගෙන බලන විට රිදියගම හා බඳගිරිය ජලාශයන්හි සියයට සියයක්ම ධීවර යින්ගේ ප්‍රධාන රැකියාව එය නිසාත්, වෙනත් කටයුතුවලට ඔවුන් දක්වන අඩු සැලකිල්ල නිසාත් අනෙක් ජලාශයන්ට වඩා මෙම ජලාශ දෙකෙහි ධීවර පවුල්වල ජීවන තත්ත්වය කෙරෙහි ධීවර කර්මාන්තයෙන් ලබාගනු ලබන ආදායම වැදගත් තැනක් උසුලයි. මෙහි සඳහන් කළ සංවිධානාත්මක ව්‍යුහයට ඇතුළත් නොවී (ධීවර සමිති වලට නොබැඳුනු) ධීවර කර්මාන්තයෙහි යෙදෙන අය ද මෙම ජලාශයන්හි සිටින අතර ඒ අයගෙන් ඇතැම් අය ධීවර කර්මාන්තය ප්‍රධාන රැකියාව වශයෙන් කරති.

ආර්ථික වශයෙන් බලන විට මෙම ධීවර පවුල්වල ආදායම් තත්ත්වය (2 වෙනි සටහන බලන්න) තරමක් යහපත් වුවත් ඔවුන් එතරම් සතුටුදායක ජීවන මට්ටමක සිටිනවා යැයි පැව සීමට අසීරුය. ඔවුන්ගේ ආදායම ස්ථිර එකක් නොවන නිසා ඔවුහු රජයෙන් දෙනු ලබන ආහාර සහනාධාරය ද ලබාගැනීමට සුදුසුකම් ලබා සිටිති. ජලාශයෙන් ජලාශයට ආදායම් මට්ටම්වල සැහෙන වෙනසක් දක්නට ලැබුනත් අධ්‍යයන ප්‍රදේශයේ ධීවර පවුලක සාමාන්‍ය වාර්ෂික ආදායම රු. 15,018 පමණ වේ. ඔවුන් නොමිලයේ ලබන ආහාර සහනාධාරයේ වටිනාකම ද මෙයට එකතු කර ඇති අතර එය මින් අඩුකර බැලුවහොත් ඔවුන් ලබන සැබෑ ආදායම් ප්‍රමාණය මීටත් වඩා අඩු බව පෙනේ. (එවිට සාමාන්‍ය ආදායම රු. 14,300 පමණ වේ.) මෙම පවුල්වල වෙසෙන සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව 5.68 වන අතර ඒ අනුව වාර්ෂික ඒකපුද්ගල ආදායම රු. 2,644 පමණ වේ. සෑම කෘෂිකාර්මික කාර්යයක්ම කාලීන මෙන්ම අඩමාන වන අතර මෙම ධීවරයින් යෙදී සිටින කාර්යයද ද ඊට සමාන ලක්ෂණ වලින් යුක්තය. ඇතැම් විට ජලාශයන් මුළුමනින්ම සිඳීයාමේ තර්ජනයට මුහුණ දෙන මෙම ධීවරයින්ගේ කාර්යය

හා ඉන් කරන ඉපයීම හේන් ගොවියාට හෝ වී ගොවියාට වඩා අඩමාන හා විචල්‍යතාවයෙන් වැඩිය. එනිසා ආදායම් මට්ටම් අනුව මෙම පවුල් දුප්පතුන් යැයි වෙන්කර හඳුන්වනු ලබන්නන් ගේ මට්ටමට වඩා ඉහළින් සිටියත් ඔවුන් දරිද්‍රතාවයේ දුක්මුසු බවින් පීඩා විඳින බව පෙනේ.

2 වෙනි සටහන

ඒ ඒ ජලාශයන්හි ධීවර පවුල්වල ඒකපුද්ගල වාර්ෂික ආදායම (රු.)

| රිදියගම | | බඳගිරිය | | වීරවිල | | තිස්ස | | යෝධවැව | | සියළුම ජලාශ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2856 | ... | 5230 | ... | 2651 | ... | 2169 | ... | 1200 | ... | 2644 |

මූලාශ්‍රය : සමාජ ආර්ථික පර්යේෂණය, 1985 ගො.ප.පු.ආ.

**ප්‍රදේශයෙහි මාළු වෙළඳාමෙහි සාමාන්‍ය ස්වරූපය**

අධ්‍යයනයට ලක් වූ ප්‍රදේශය ගැන සලකා බලන විට මාළු වෙළඳාමේ සංවිධානාත්මක ස්වරූපය, විකුණන ආකාරය, මිල, වෙළඳුන්ගේ ප්‍රමාණය හා ස්වභාවය ජලාශයෙන් ජලාශයට වෙනස් වේ. වෙළඳපොල මාර්ග (Marketing Channels) පිළිබඳව සලකා බලන විට ඒවා දක්වා ඇති සටහනෙහි (3 වෙනි සටහන බලන්න) ප්‍රථමයෙන් දක්වා ඇති මාර්ගය ප්‍රදේශයෙහි මාළු වෙළඳාමෙහි දී ප්‍රමුඛස්ථානය හිමිකර ගනී. මාළු වැනි ඉක්මණින් නරක්වන සුළු දෙයක් සඳහා වඩාත් වැදගත් වන්නේ දෙවනුව දක්වා ඇති ආකාරයේ නිෂ්පාදකයාගෙන් කෙලින්ම පාරිභෝගිකයා අතට බෙදා හරිනු ලබන ක්‍රමයක් වුවත් නිෂ්පාදිත ප්‍රදේශය ආශ්‍රිතව හොඳ වෙළඳපොලක් නොමැති නිසා එය ක්‍රියාවේ යෙදවීමට අපහසු තත්ත්වයක් පවතී.

3 වෙනි සටහන

විවිධ ආකාරයේ වෙළඳපල මාර්ග

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. | ධීවරයා | — | වෙළෙන්ද | — | පාරිභෝගිකයා | |
| 2. | ධීවරයා | — | පාරිභෝගිකයා | | | |
| 3. | ධීවරයා | — | වෙළෙන්ද/තොග වෙළෙන්ද | — | සිල්ලර වෙළෙන්ද | — පාරිභෝගිකයා |
| 4. | ධීවරයා | — | භෝජන ශාලාව | — | පාරිභෝගිකයා | |

මෙම ජලාශයන්හි ධීවරයින්ගෙන් වැඩි ප්‍රමාණයක් මාළු විකුණන්නේ දිනපතා ජලාශයන් වෙත පැමිණෙන වෙළඳුන්ටය. මෙසේ ජලාශයන් වෙත පැමිණෙන වෙළඳුන් අතර බයිසිකල් සහ මෝටර් සයිකල් කරුවන් මෙන්ම තම ලොරි මගින් මාළු ප්‍රවාහනය කරනු ලබන ව්‍යාපාරිකයෝ ද සිටිති. ඇතැම් ජලාශයන්හි ධීවරයෝ තමන් විසින් ම කිට්ටුව පිහිටි පොලවල් හා නගරයන් වෙත ගෙනගොස් තම මාළු විකුණති.

ජලාශයන්ට කිට්ටුව පිහිටි නගරයන්හි ඇති තරම් කරදිය මාළු තිබෙන නිසාත්, ඒවායේ මිරිදිය මාළු සඳහා හොඳ ඉල්ලුමක් නොමැති නිසාත්, මෙම ජලාශයන්ගෙන් මාළු මිලදී ගන්නා වෙළෙන්දෝ මිරිදිය මාළු සඳහා හොඳ ඉල්ලුමක් ඇති දුර බැහැර ප්‍රදේශ කරා ඒවා ගෙනයති. බයිසිකල් කරුවන් ජලාශයන්ට කිට්ටුව පිහිටි ග්‍රාමීය ප්‍රදේශ වලටත් මෝටර්සයිකල් කරුවන් ජලාශයන්ගෙන් තරමක් ඈතින් පිහිටි ග්‍රාමීය ප්‍රදේශවලටත් මාළු ගෙනයන අතර ලොරි වලින්

මාළු ප්‍රවාහනය කරන ව්‍යාපාරිකයෝ ඒවා දුරබැහැර ප්‍රදේශවල පිහිටි වෙළඳපොලවල් කරා ගෙනයති. මෙවැනි වෙළඳපලවල් අතර කරදිය මාළු පහසුවෙන් නොලැබෙන හා මිරිදිය මාළු සඳහා හොඳ ඉල්ලුමක් ඇති එහෙත් සැතැපුම් 30 පමණ දුරින් පිහිටා ඇති මිද්දෙනිය, වීරකැටිය, වලස්මුල්ල ආදී ප්‍රදේශ වැදගත් තැනක් ගනී.

වෙළඳුන් වඩාත් ග්‍රාමීය පෙදෙස් වෙත මසුන් ප්‍රවාහනය කරමින් අධික මිලකට විකුණුවද අධ්‍යයන ප්‍රදේශයේ ධීවරයින් ඉන් ලබන ප්‍රයෝජනය ඉතා අල්පය. මෙයට හේතුව වී තිබෙන්නේ මාළු මිලදී ගැනීමේ දී ඇතිවී තිබෙන ඒකාධිකාරී හෝ කතිපයාධිකාරී (Monopsonic or Oligopsonic) ක්‍රමයයි. මෙම වෙළඳුන් විසින් මාළු මිලදී ගැනීමේදී එම මසුන් සඳහා ගෙවන්නේ කලින් තීරණය කරගත් මිලක් වන අතර, වෙළඳපලෙහි කලින් කල මිල මට්ටමෙහි ඇතිවනු ලබන වෙනස්කම් අනුව මසුන් සඳහා ගෙවන මිල මට්ටම වෙනස් නොවේ. (එහෙත් දිගු කාලීන වශයෙන් බලන විට මිලෙහි වෙනස්කම් ඇති වී ඇත.) අධ්‍යයනය කල කාලයේදී එක් මාළු කිලෝවක් සඳහා ගෙවූ මුදල රු. 3.50 ක් පමණ විය. කුමන මිලක් ගෙව්ව ද ධීවර උපකරණ හා ණය ලබාදීම ආදී වෙනත් හේතු නිසා ඉහත දක්වූ වෙළඳුන්ටම මාළු සැපයීමට ධීවරයින්ට සිදු වී ඇත. මේ අයටම මාළු සැපයීමට හේතු වී ඇති අනික් කරුණ නම් මෙම වෙළඳුන් විසින් වෙනත් වෙළඳුන් පැමිණීම වලක්වන නිසා මාළු සැපයීමට වෙනත් අය නොමැතිවීමයි.

**ඒ ඒ ජලාශයන්හි ඇති වෙළඳාමේ ස්වරූපය**

එකිනෙක ජලාශයන්හි ඇති වෙළඳුන්ගේ ස්වභාවය හා ප්‍රමාණයන් පිළිබඳව 4 වෙනි සටහනින් දක්වා ඇති අතර ඒ ඒ ජලාශයෙහි පවත්නා වෙළඳාම හා සම්බන්ධ විශේෂිත ලක්ෂණ මෙහි දී ගෙනහැර දැක්වීම සුදුසු යයි සිතමි. රිදියගම ජලාශයෙහි විශේෂිත ලක්ෂණය වන්නේ ඒ ඒ ඔරුව සඳහා වෙන වෙනම බයිසිකල් කරුවන් සිටීමයි. බඳගිරියෙහි තත්ත්වය මීට වඩා හාත්පසින්ම වෙනස්ය. එහි වෙළඳාම මුළුමනින්ම වාගේ රැඳී පවතින්නේ තම ලොරි වලින් මාළු ප්‍රවාහනය කර විකුණනු ලබන ලොකු වෙළඳුන් දෙදෙනෙකු අතෙහිය. වීරවිල හා තිස්ස ජලාශයන්හි වෙළඳුන්ගේ සහභාගිත්වය ඉතා අඩු වූ අතර ධීවරයින් විසින් ම ඔවුන්ගේ මාළු ආසන්නයේ හෝ තරමක් දුරින් පිහිටි පොලවල් කරා ගෙනගොස් විකුණනු ලැබේ. යෝධ වැවෙහි මසුන් වලින් භාගයක් පමණ ලොකු වෙළෙන්දෙකු විසින් ලබාගනු ලබන අතර ඉතිරියෙන් ද සෑහෙන කොටසක් අනෙකුත් වෙළඳුන් විසින් මිළදී ගැනේ.

4 වෙනි සටහන

ඒ ඒ ජලාශය යටතේ සිටින වෙළඳුන්ගේ ස්වභාවය

| | රිදියගම | බඳගිරිය | වීරවිල | තිස්ස | යෝධවැව | සියළුම ජලාශයන් |
|---|---|---|---|---|---|---|
| බයිසිකල් කරුවන් | 40 | 6 | 4 | 3 | — | 53 |
| මෝටර්සයිකල්කරුවන් | 3 | 2 | — | — | — | 5 |
| ලොකු වෙළඳුන් (ලොරි වලින් එන) | — | 2 | — | — | 1 | 3 |
| පෙට්ටිකරුවන් | — | — | — | — | 3 | 3 |
| | 43 | 10 | 4 | 3 | 4 | 64 |

මූලාශ්‍රය : සමාජ ආර්ථික පර්යේෂණය, 1985 ගො.ප.පු.ආ.

**වැඩිවාසින් අත්කර ගැනීමේ ක්‍රියාමාර්ග**

ධීවරයින්ගේ බලකිරීම මත යම්කිසි බලපෑමක් වුවත් ප්‍රදේශයේ මාළු මිල තීරණය කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන්ම වෙළඳුන් විසිනි. විශේෂයෙන්ම බඳගිරිය ජලාශයෙහි මිල පාලනය කරනු ලබන්නේ එකට එකතු වී උපක්‍රමශීලීව කටයුතු කරනු ලබන වෙළඳුන් දෙදෙනෙකු විසිනි. මෙම වෙළඳුන් විසින් මාළු වෙළඳාම තුළින් වැඩි වාසි අත්කර ගැනීම සඳහා අනුගමනය කරන ප්‍රධාන ක්‍රමය වන්නේ ධීවරයින්ගෙන් මිලට ගන්නා මාළු සඳහා අඩුමිලක් ගෙවීමයි. මෙම අධ්‍යයනය කරන අවධියෙහි දී රිදියගම ජලාශයෙහි මත්ස්‍යයෙකු සඳහා රු. 1.00 ක් ගෙවූ අතර එහි මාළු කිලෝවක මිල රු. 4.00 පමණ විය. බඳගිරිය ජලාශ යෙහි මාළු ඊට වඩා කුඩා බැවින් එම මාළුවකු සඳහා ශත 60 ක් ගෙවූ අතර එම මාළු කිලෝවක මිල රුපියල් 3.00 පමණ විය. යෝධ වැවෙහි ද මාළු මිල බඳගිරියට සමාන විය. වෙළඳුන් මෙම මාළු ඈත ප්‍රදේශවලට ගෙනගොස් විකුණනු ලබන්නේ කිලෝවක් රු. 6–10 අතර ගණන කට වන අතර සමහර අවස්ථාවල දී මෙම මිල මීටත් වඩා ඉහළ යයි. කෙසේ නමුත් මේ තුළින් වෙළඳුන්ට අධික ලාභයක් ලැබෙන බව වෙළඳපල ආන්තිකයන් (Market Margins) දැක්වෙන සටහනින් පැහැදිලි වේ.

5 වෙනි සටහන
නිෂ්පාදන/වෙළඳපල වියදම් සහ ආන්තිකයන්
(එක් මාළු කිලෝග්‍රෑමයක් සඳහා ගණනය කරන ලදි.)

| අවස්ථා | විස්තර | රුපියල් | ඒ ඒ මට්ටමේදී අවසන් පාරිභෝගික මිලෙහි ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| පළමුවැනි අවස්ථාව | නිෂ්පාදකයාගේ වියදම (යාත්‍රා, ආම්පන්න හා ශ්‍රම කුලිය ඇතුළුව) ... | 1.93 | 28% |
| | නිෂ්පාදකයාගේ ලාභාන්තිකය ... | 1.57 | 22% |
| | නිෂ්පාදකයා විසින් වෙළෙන්දට විකුණන මිල ... | 3.50* | — |
| දෙවැනි අවස්ථාව | වෙළෙන්දගේ වියදම එකතු කිරීම , ඇහිරීම, අයිස් දැමීම, ප්‍රවාහනය හා නරක්වන ප්‍රමාණය ඇතුළුව) ... | 0.90 | 13% |
| | වෙළෙන්දගේ ලාභාන්තිකය ... | 2.60 | 37% |
| | වෙළෙන්ද විසින් පාරිභෝගිකයාට විකුණනු ලබන මිල ... | 7.00 | |

* නිෂපාදකයාගේ මිල මට්ටම පාරිභෝගිකයාගේ මිලෙහි ප්‍රතිශතයක් වශයෙන් : 50%

මූලාශ්‍රය : සමාජ ආර්ථික පර්යේෂණය, 1985 ගො.ප.පු.ආ.

වෙළඳපල ආන්තිකයන් පිළිබඳව විමසා බැලීමේ දී පාරිභෝගිකයාගේ මිලෙන් අධික කොට සක් එනම් සියයට පනහක් වෙළෙන්ද වෙතට යනු ලැබේ. වෙළඳ පල වියදම් වෙනුවෙන් වෙළෙන්දට දැරීමට සිදුවන්නේ මින් ඉතා ස්වල්ප ප්‍රමාණයක් වන අතර වැඩි කොටසක් ඔහුගේ ලාභාන්තය හැටියට ගැනේ. නිෂ්පාදකයා හෙවත් ධීවරයා විසින් දරණ නිෂ්පාදන පිරිවැය වෙළන්ද විසින් දරණ වියදම් වලට වඩා අධික නමුත් ඔහුගේ ලාභාන්තිකය වෙළෙන්දට වඩා බෙහෙවින් අඩුය. මෙහි දී මිල ගණන් පිළිබඳව සාකච්ඡා කිරීමේදී මාළු කිලෝවක පාරිභෝගික මිල වශයෙන් සඳහන් කරන ලද්දේ ඉතා අඩු මුදලක් වූ රු. 7.00 කි. නමුත් මෙය මීට වඩා ඉහල යන අවස්ථා ඇති අතර එවැනි අවස්ථාවල දී මාළු මිල ඉහළ ගිය ද ධීවරයාට ගෙවන මිල ගණන්වල වෙනසක් නොකරන නිසා වෙළෙන්ද ගේ ලාභාන්තිකය ක්‍රමයෙන් වැඩිවේ.

මිරිදිය මාළු සඳහා පවත්නා අඩු ඉල්ලුම නිසා වෙළඳුන් අත හැමවිටම අවධානම්කාරී තත්ත්වයක් ඇතැයි හැඟී ගියත්, ඔවුන් මසුන් ගෙනයන ග්‍රාමීය පෙදෙස්වල මේ මාළු සඳහා හොඳ ඉල්ලුමක් තිබෙන නිසා පාඩු ලැබීමට තිබෙන ඉඩකඩ අඩුය. මාළු විශාල ලෙස ඉතිරිවූ අවස්ථාවලදී එම මාළු සඳහා මුදල් දීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ ඒවා කරවල බවට පත් කිරීමෙන් වෙළෙන්දෝ තමන්ට අත්වීමට තිබෙන පාඩුව නැතිකර ගැන්මට පියවර ගනිති. මෙසේ මාළු ඉතිරිවීමෙන් සමහර අවස්ථාවලදී තමන්ට පාඩු සිදුවීමට ඉඩ ප්‍රස්ථාවක් ඇති බව පෙන්නුම් කරන වෙළෙන්දෝ තමන් ධීවරයින්ගේ මාළු සඳහා ගෙවනු ලබන මිල ප්‍රමාණයන් බෙහෙවින්ම ප්‍රමානවත් යැයි ඔවුන්ට ඇඟවීමට උත්සාහ දරති.

මාළු මිල සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලන විට මෙම ජලාශයෙන්හි මාළු මිලට ගන්නා වෙළඳුන් අතර, තරඟකාරිත්වයක් නොමැති බැවින් වෙළඳුන්ට පහසුවෙන්ම දිගු කලක් යනතෙක් සමාන මිල මට්ටමක් පවත්වාගෙන යා හැකිය. සියළුම ධීවරයින් එකතු වී මිල ප්‍රමාණවත් නොවේ යැයි උද්ඝෝෂණයක් කළහොත් පමණක් වෙළඳුන් මිල මට්ටම සුළු ප්‍රමාණයකින් ඉහල දැමීමට සැලකිල්ල යොමු කරනු ලැබේ. රිදියගම ජලාශය ගැන සලකා බලනවිට ඒ ඒ ඔරුව සඳහා වෙන් වෙන් වශයෙන් වෙළඳුන් සිටින නිසාත්, එක ඔරු වකින් මසුන් මිලට ගන්නා වෙළෙන්දෙකු වෙනත් ඔරුවකින් මාළු නොගන්නා නිසාත්, වෙළඳුන් අතර තරඟකාරිත්වයක් නොමැත. බඳගිරියෙහි ද පවත්නේ මීට සමාන තත්ත්වයකි. එහි ලොරි වලින් පැමිණෙන වෙළඳුන් දෙදෙනා ජලාශයෙහි තොටුපළවල් දෙකෙහි මසුන් සම්බන්ධයෙන් ඒකාධිකාරිත්වය පිහිටුවාගෙන සිටිති. එකිනෙක තොටුපල වල සිටින ධීවරයින් හැමදම තමන්ගේ තොටුපල වෙත පැමිණෙන වෙළෙන්ද වෙත මාළු දෙන අතර මෙම වෙළඳුන් ද දිනපතා මිලදී ගන්නා පුද්ගලයාගෙන් මිස වෙනත් අයගෙන් මාළු මිලදී නොගනිති.

තරඟකාරිත්වයක් නොමැති නිසා එක් දිනක දී යම්කිසි වෙළෙන්දෙකු නොපැමිණියහොත් ඔහුට මාළු දෙන ධීවරයින්ට ඒවා විකුණා ගැන්මට නොහැකි වේ. එනිසා එසේ නොපැමිණෙන අවස්ථාවලදී ඒ බව කලින් දක්වන අතර අදල ධීවරයෝ මාළු ඇල්ලීමට යාමෙන් ද වලකිති. යෝධ වැවෙහි ද තත්ත්වය බොහෝ සෙයින් මීට සමානය. එහි බොහොමයක් ධීවරයින් එක් වෙළෙන්දෙකු මත රැඳී සිටින නිසා අන් ජලාශවල මෙන් වෙළඳාමේ නොයෙකුත් අවස්ථාවලදී ඔහුගේ බලපෑමට යට වීමට ඔවුන්ට සිදුවේ.

වීරවිල සහ තිස්සවැව ජලාශවල ධීවරයින් මෙන්ම යෝධවැව ජලාශයේ ඇතැම් ධීවරයින් තමන් විසින් ම මාළු විකුණන නිසා කලින් දක් වූ ධීවරයින්ට වඩා තම මාළුවලට හොඳ මිලක් ලබා ගැනීමට හැකි වී තිබේ. මෙම ජලාශ නාගරික ප්‍රදේශවලට ආසන්නව පිහිටි නිසා එහි සතියේ වෙළඳපොලවල් හා පාරිභෝගියන් වෙත අලෙවි කිරීමෙන් ධීවරයින්ට මාළු කිලෝවක් සඳහා අඩුම වශයෙන් රු. 6/- වැනි මුදලක් ලබාගත හැක. ඇතැම් අවස්ථාවලදී මේ මුදල රු. 10/- ටත් අධික වෙයි. මෙහි අතරමැදියෙකු නොමැති නිසා ධීවරයාගේ ලාභාංශය ඉහළ මට්ටමක පවතී.

රිදියගම හා බඳගිරිය ජලාශයන්හි ධීවරයින්ට තම මාළු විකිණීමේදී වෙළඳුන් සමඟ කේවල් කිරීමේ ශක්තිය (bargain power) නොමැතිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ තම මාළු තමන් බැඳී සිටින වෙළඳුන්ට නොදී වෙනත් විකුණා ගැන්මේ මාර්ගයක් නොමැති නිසාය. මෙම ජලාශ දෙක පිහිටා තිබෙන්නේ බොහෝ සෙයින්ම හුදකලා ප්‍රදේශවලය. (රිදියගම ජලාශය අම්බලන්තොට නගරයේ සිට සැත. 8 ක් පමණ ඈතින් පිහිටා ඇති අතර බඳගිරිය ජලාශය හම්බන්තොට-තිස්ස මාර්ගයේ සිට සැත. 5 දුරින් හා හම්බන්තොට නගරයේ සිට සැත. 12 ක් ඈතින් පිහිටා ඇත). එනිසා එක් අතකින් නගරවලට මාළු ගෙනඒමට එතරම් පහසුකම් නොමැති අතර අනික් අතින් එම නගරවලදී කරදිය මාළු සමඟ තරඟ කිරීමට සිදුවන නිසා ඉහළ ප්‍රමාණයක් අලෙවි කරගැනීමට මෙන්ම මිලෙන්ද ඉහළ මට්ටමක් ලබා ගැනීමට නො හැකිය. නමුත් තිස්ස, දෙබරවැව, පන්නගමුව වැනි නාගරිකයන් හම්බන්තොට හා අම්බලන්තොට හා සසඳා බලනවිට වෙරළේ සිට සැහෙන දුරකින් පිහිටි නිසාත්, රිදියගම හා බඳගිරියේ මෙන් විශාල ප්‍රමාණයක් නොමැති නිසාත්, වීරවිල හා තිස්ස ජලාශවල ධීවරයින්ට ආසන්නයේ පිහිටි නාගරික ප්‍රදේශ ඇශ්‍රයෙන් මාළු විකිණීමට යාමේදී කරදිය මාළු වලින් විශාල තර්ජනයක් එල්ල නොවේ.

අඩු මිලක් ගෙවීමේ ක්‍රමයට අමතරව වෙළඳුන් විසින් වැඩිවාසීන් අත්කර ගන්නා තවත් මාර්ග තිබේ. මින් එක් මාර්ගයක් වන්නේ සමහර කාෂිභෝග මෙන් ඇතැම් මසුන් වර්ග විකිණිය නොහැකි බව අහවමින් මිලදී නොගැනීමයි. මෙවැනි වර්ග අතර වීනා හෙවත් වීන්නු (Big Heal Carp) ආදා, (Eel) සහ පෙතියා (Petiya) වැදගත් වේ. මෙම ජලාශ ආසන්නයේ වෙසෙන ජනතාව අතර මෙම මසුන් වර්ග ජනප්‍රිය නොවන අතර, ඒවා කෑම සඳහා ද ඔවුහු කැමැත්තක් නොදක්වති. එසේ වුවද වෙළඳුන් විසින් මසුන් ගෙන යනු ලබන ප්‍රදේශවල ඒ වර්ග විකිණීමේ හැකියාව ඇත. හැම දූලකටම වාගේ මේ වර්ගවල මසුන් විශාල වශයෙන් හසු නොවූවත් කිප දෙනෙකු අසුවෙ. එම ප්‍රමාණය අල්ලනු ලබන මුළු මත්ස්‍ය ප්‍රමාණයෙන් සියයට පහත්-දහයත් අතර ප්‍රමාණයක් වේ. රිදියගම ජලාශයෙහි ධීවරයෝ එවැනි මසුන් වෙළඳුන්ගේ ප්‍රයෝජනය සඳහා ඔවුන්ට නොමිලයේ දෙති. බඳගිරියෙහි ද පවත්නේ මීට සමාන තත්ත්වයකි. එහි මාළු ගණන්කර අවසාන වූ විගස විකිණිය නොහැකි යැයි සම්මත මසුන් වර්ග මුදල් අය කිරීමකින් තොරව වෙළඳුන්ගේ කූඩවලට දමනු ලැබේ. බඳගිරියෙහි ලොරි වලින් මසුන් ප්‍රවාහනය කරන වෙළඳුන් ධීවරයින් සැහෙන සංඛ්‍යාවකින් මසුන් මිලදී ගන්නා නිසා මිලදී ගැනීම අවසානයේ දී හැම ධීවරයෙකුගෙන්ම නොමිලයේ ලැබුණු මසුන් එකතුකර බලන විට එය සැහෙන ප්‍රමාණයක් වෙයි. මෙම මසුන් වෙළඳුන් විසින් ප්‍රවාහනය කරන ප්‍රදේශවලදී සැහෙන මුදලකට විකුණනු ලැබේ. ඒවා නොමිලයේ ලැබුණු ඒවා නිසා කුමන මිලකට විකුණුවද ඔවුන්ට ලාභයක් මිස ඉන් පාඩුවක් අත්වන්නේ නැත. අප අධ්‍යයනයේ දී හමු වූ එක් බඳගිරියේ වෙළෙන්දෙකු පැවසූ පරිදි සම්පූර්ණයෙන්ම විකිණිය නොහැකි මසුන් වර්ග කිසිවක් නොමැත. ඔහුට අනුව වඩාත් ජනප්‍රිය වූ කොරළි (Japanese Carp) හා සමාන මුදලක් ලබාගත නොහැකි වුවත් විකිණිය නොහැකියැයි සම්මත මසුන් විකිණීමට අපහසුවක් නොමැත.

කිට්ටුව පිහිටි ග්‍රාමීය ප්‍රදේශවල හෝ වෙළඳපලවල් වල වැසිදයක වෙළඳ තත්ත්වයක් තිබුන වුවද මෙම ධීවරයින්ට දහවල් කාලයේදී මසුන් විකිණීමෙහිලා සහභාගි විය නොහැකිය. මෙයට හේතුව ඔවුන් මසුන් අල්ලනු ලබන්නේ රාත්‍රිකාලයේ නිසා අධික වෙහෙසට පත්ව සිටීමයි. එනිසා කුමනාකාරයේ වෙළෙන්දකු තමන් වෙත ආවත් තම මාළු ඔහුට විකුණා දැමීමට සිදුවේ. අනෙක් කරුණ නම් විශේෂයෙන්ම බඳගිරියෙහි හා රිදියගම ජලාශයන්හි ධීවරයින්ට වෙනත් ආදායම් මාර්ග අඩු නිසාත් ඔවුන්ගේ ප්‍රධාන ජීවන මාර්ගය ධීවර කර්මාන්තය නිසාත් ඔවුනට ඔවුන්ගේ මාළු මිලදී ගැනීමට නොකඩවා පැමිණෙන වෙළඳුන් සිටින බවට සහතිකයක් අවශ්‍ය ය. වරක් බඳගිරිය ජලාශයේ ධීවරයින් සංවිධානය වී මසුන් ඇල්ලීමට

යාමෙන් වැලකීම මගින් තමන්ට ගෙවන මිල වැඩි කරන ලෙස වෙළඳුන්ගෙන් ඉල්ලා ඇත. එහෙත් ඔවුන්ගේ වර්ජන ව්‍යාපාරය වැඩිකල් නොපැවතී අසාර්ථක ලෙස අවසන් වී ඇත. එයට හේතු ව වී ඇත්තේ එය පටන්ගෙන දින දෙකකට පමණ පසු එයට සහභාගි වූ ඇතැම් ධීවරයින් තමන් විසින් වෙළෙඳුන්ට කලින් දුන් මිලටම තවදුරටත් මාළුදීමට වෙළඳුන් සමඟ හොර රහසේම එකඟවීමයි. මෙවැනි තීරණයක් ගැනීමට ඇතැම් ධීවරයින් පෙළඹී ඇත්තේ එදිනෙද ජීවත් වීම සඳහා මුහුණදුන් ආර්ථික ගැටළු මෙන්ම තමන් විසින් එසේ තවදුරටත් කටයුතු කිරීම නිසා වෙළඳුන් නොපැමිණියහොත් තමන්ගේ මාළු විකුණා ගැන්මට ක්‍රමයක් නොමැති නිසා රැකියාව මුළුමනින්ම අතහැර දැමීමට සිදුවේ ය යන බිය නිසාය.

වෙළඳුන් නොපැමිණෙන්නේ නම් තම මාළු, 'වේලීම' තවදුරටත් විකල්ප රැකියා මාර්ගයක් හැටියට භාවිතා කළහැකි වුවත් ඒවාට හොඳ ඉල්ලුමක් නොමැති නිසාත්, ඒවා මිලදී ගැනීම සඳහා වෙළඳුන් මෙතෙක් ඉදිරිපත් වී නොමැති නිසාත් ඒවා නිපදවීමට අවශ්‍ය පහසුකම් නොමැති නිසාත්, එසේ කිරීමට නොහැකි තත්ත්වයක් පවතී. අනෙක් වැදගත්ම කාරණය වන්නේ මෙම ධීවරයින්ට අතිරේක ආදායම් මාර්ග අඩු නිසා ඔවුන්ට එදිනෙද ජීවත්වීම සඳහා මුදල් සොයාගැනීමේ අවශ්‍යතාවයයි. මේ නිසා මසුන් වියලා මුදල් ලබාගන්නා තෙක් ඔවුන්ට බලාසිටීමට නොහැකි අතර ඒවා යථා තත්ත්වයෙන්ම විකුණා මුදල් බවට පත් කළ යුතුය.

බඳගිරිය ජලාශයෙහි ආඳන් (Eels) සෑහෙන ප්‍රමාණයක් සිටින අතර ඔවුන් විසින් ධීවරයින් විසින් එලනු ලබන දැල්වලට හසුවන අනෙක් මාළුවන්ට හානි පමුණුවනු ලැබේ. මොවුහු කොරලි වැනි මාළුන්ගේ කරමල් අතරින් රින්ගා ලේ උරා බොති. මෙසේ ආඳන්ගේ ලේ උරාබීමේ ක්‍රියාවලියට ලක්වූ මසුන් පහසුවෙන් විකිණිය නොහැකි යයි අඟවන බඳගිරිය ජලාශයේ වෙළඳුන් එවැනි මාළුන් මිලදී ගනු ලබන්නේ එක් මාළුවකුට ගෙවිය යුතු නියම මිලෙන් බාගයක් ගෙවීමෙනි. එසේ නමුත් වෙළෙන්දෝ මේවා වෙනම නොවිකුණනු ලබන අතර මසුන් විකුණන ප්‍රදේශවලදී ඒවාත් අනෙක් මාළු හා මිශ්‍ර කිරීමෙන් බොහෝ විට ඒ හා සමාන මුදලක් ලබාගනිති. මෙසේ ආඳන්ගේ ගිරිහැරයට පාත්‍ර වූ මසුන්ට විශාල හානියක් සිදුවී නොමැති නිසා ඒවා එතරම් අපහසුවක් නොමැතිව විකිණීමට හැකිවන අතර, ඒ තුළින් වෙළෙන්දෝ වැඩිවාසින් අත්කර ගනිති. එම ජලාශයේ අල්ලන මසුන්ගෙන් සියයට දහයත්-පහලොවත් අතර ප්‍රමාණයක් මේ ගණයට ඇතුළත් වන නිසා එය වෙළඳුන්ට වාසිදයක තත්ත්වයක් අත්කර දී ඇත.

ඔවුන් විසින් වැඩිවාසින් අත්කර ගන්නා අනෙක් උපක්‍රමය නම් මිලදී ගන්නා මසුන්වලට මිලදී ගන්නා අවස්ථාවේදී ම මුදල් නොගෙවීමයි. සාමාන්‍යයෙන් එම මුදල් බේරනු ලබන්නේ පසුවද හෝ සතියකට වරක් බැගිනි. රිදියගම හා යෝධවැව ජලාශයන්හි වෙළඳුන් ඒවා පසුවදම බේරනු ලබන මුත් බඳගිරියෙහි ලොකු වෙළඳුන් ඒවා බේරනු ලබන්නේ සතිය අව සානයේදීය. රිදියගම ජලාශයේ වෙළෙන්දෝ පසුවද මුදල් බේරීමේ දී විශාල වශයෙන් මසුන් ඉතුරු වූ අවස්ථාවලදී ඒවා සඳහා ගෙවිය යුතු මුදල් ධීවරයාගෙන් ගත් මුළු මාළු ප්‍රමාණය සඳහා ගෙවිය යුතු මුදලින් අඩු කරති. කලින් දින ගෙනගිය මාළු ඉතුරු වූ බව ඔප්පු කිරීම සඳහා ඇතැම්විට ඒවා පසුවද එනවිට ගෙනැවිත් ධීවරයින්ට පෙන්වති. බඳගිරිය ජලාශයෙහි සතියකට වරක් මුදල් බේරුව ද ධීවරයින්ට එදිනෙද ජීවත්වීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් දෙනු ලැබේ. කෙසේ වෙතත් සතිය අවසානයේ දී මුදල් ගෙවීම නිසා ධීවරයින්ගේ මුදල් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් වෙළඳුන් අතර රැඳෙන අතර ඔවුන්ට ඒවා වෙනත් කටයුතු සඳහා යෙදවීමට හැකියාව ලැබේ.

ධීවරයින් සහ වෙළඳුන් අතර පවත්නා සම්බන්ධතාවය විකුණන්නන් හා මිලදී ගන්නන් අතර පවත්නා සබඳතාවක් පමනක් නොව වැඩවසම් සමාජීය ස්වාදයක හා අනුග්‍රහක සබඳතා පිළිබිඹු කරන්නකි. බඳගිරිය සහ යෝධවැව ජලාශයන්හි ලොකු වෙළඳුන් හා ධීවරයින් අතර පවත්නා සම්බන්ධතාවන් දෙස බැලීමෙන් මෙය මනාව පැහැදිලි වේ. බඳගිරිය ජලාශය වෙත පැමිණෙන ලොකු මාළු වෙළඳුන් දෙදෙනා එම ජලාශයේ සිට සැ. 5 පමණ දුරින් පදිංචිව සිටින අතර සැහෙන ධනයක් හා ප්‍රසිද්ධියක් ඇති අය වෙති. යෝධ වැවෙහි මාළු මිලදී ගන්නා වෙළෙන්ද ද මීට සමානය. එහි පදිංචිව සිටින අන් පවුල් හා සසඳා බලන විට මොහු ප්‍රදේශයේ වඩාත්ම ධනවත් පුද්ගලයා ලෙස කැපී පෙනේ. මෙසේ සැහෙන ධනවත් හා බලපෑම් කළහැකි පුද්ගලයින් වශයෙන් මොවුන් ධීවරයින් විවිධාකාරයෙන් තම අනසක යටතේ තබා ගැනීමට උත්සාහ දරති.

මොවුන් අතර පවත්නා සබඳතාව දෙපිරිස අතර එදිනෙද සිදුවන ගණුදෙනු වලින් මනාව පැහැදිලි කෙරේ. උදාහරණ වශයෙන් ධීවරයින්ට දැල් අවශ්‍ය වූ විට ඒවා උපයා ගන්නා ආකාරය දැක්විය හැක. බඳගිරිය හා යෝධවැව ධීවරයින් දැල් අවශ්‍ය වූ විට ඒවා මිලදී ගැනීමට තරම් තමන් ලඟ මුදල් නොමැති නිසා වෙළඳුන්ට දන්වන අතර ඒ අය ධීවරයින් සඳහා තමන්ගේ මුදලින් දැල් මිලදී ගනිති. දැල් සඳහා ඔවුන්ගෙන් ගිය මුදල දිනපතා සපයන මාළු සඳහා ගෙවිය යුතු මුදලෙන් කොටස් වශයෙන් අයකර ගනු ලැබේ. යෝධවැව ජලාශයට සහනාධාර ඔරු ලබාදීමේදී එහි සිටින ඇතැම් දුප්පත් ධීවරයින්ට එම ඔරු සඳහා ගෙවිය යුතු මුදලවත් ගෙවීමට නොහැකි තත්ත්වයක පසුවී ඇති අතර එම ජලාශයේ ධීවරයින් අතර ජනප්‍රියත්වය ලබා සිටින වෙළෙන්ද විසින් එවැනි ඔරු 10ක් පමණ තමන්ගේ මුදල් ගෙවා ඔවුනට ලබා දී තිබේ. මෙම ඔරු සඳහා වියදම් කල මුදල් ද මාළු මිලදී ගැනීමේ දී කොටස් වශයෙන් අය කරනු ලැබේ.

වෙළඳුන් විසින් ධීවරයින්ට වරින්වර දැල් ආදී උපකරණ ලබාදීම විශාල සහනයක් වුවත් අනෙක් පැත්තෙන් බලන විට ඉන් සිදුවන්නේ ඔවුන්ව වෙළඳුන්ගේ ග්‍රහණයට වක්‍රව හසුකර ගැනීමයි. මේ හේතුවෙන් තමන්ගේ මාළු සඳහා අධික මිලක් ඉල්ලා කේවල් කිරීමේ බලය ධීවරයින්ට අහිමි වේ. එපමණක් නොව ඔවුන්ට එම වෙළඳුන්ට මාළු දීමෙන් ඉවත්වීමට ද නොහැක. ධීවර කර්මාන්තයේ දී මේ ආකාරයට නිෂ්පාදකයා හා වෙළෙන්ද අතර නිෂ්පාදන උපකරණ' සම්බන්ධයෙන් පවත්නා සබඳතාව වී ගොවිතැනේ දී ද ඒ ආකාරයටම දැකගත හැකිවනු ඇත. එහිදී ට්‍රැක්ටර් හා වෙනත් උපකරණ මිලදී ගැනීම සඳහා ගොවීන්ට ණය සපයනු ලබන වෙළෙන්දෝ ඒ තුළින් ගොවීන් තම ග්‍රහණයට හසුකර ගැනීමෙන් හා තමන් ගෙන් ලබාගත් ණය හා ඒ සඳහා ගෙවිය යුතු පොළී අයකර ගැනීමේ මුවාවෙන් ගොවීන්ගේ නිෂ්පාදන අතිරික්තය ඉතා සූක්ෂම අයුරින් උකහා ගනිති.

ඉහත දැක්වූ පරිදි ධීවර කර්මාන්තයට අදාල ආම්පන්න ආදිය සපයා දීමට අමතරව වෙළෙන්දෝ ධීවරයින්ට හදිසි අවස්ථාවලදී පොලී අය කිරීමෙන් හෝ ඇතැම් අවස්ථාවලදී පොලී අයනොකරම ණය මුදල් දෙති. ධීවර කර්මාන්තයේ ඇති කාලීන බව නිසා බොහෝ ධීවරයින්ට රැකියාව නැති කාලයේදී පරිභෝජනය සඳහා අනිවාර්යෙන්ම ණය ලබාගැන්මට සිදුවේ. (Lawson, K. M., 1979) මෙම ණය වෙළඳුන් අය කරගනු ලබන්නේ මාළු වලට ගෙවිය යුතු මුදල් වලිනි.මෙවැනි මුදල්මය ආධාරවලට අමතර ජීවිතයේ සාමාන්‍ය අවස්ථාවලදී ද වෙළඳුන් හා ධීවරයින් අතර කිට්ටු සහයෝගීතාවයක් දක්නට ලැබේ. එවැනි එක් අවස්ථාවක් නම් බඳගිරියේ ධීවරයින්ගේ පවුලක යම්කිසි අයකු අසනීප වී රෝහලක් වෙත ගෙන යාමට අවශ්‍ය වූ අවස්ථාවලදී එහි වෙළඳුන් විසින් ඒ සඳහා වාහන සැපයීමෙන් උපකාර කිරීමයි. මේ ආකාරයට වෙළඳුන් හා ධීවරයින් අතර පවත්නා සබඳතාවන්හි අවසන් ප්‍රතිඵලය වන්නේ වෙළඳුන් විසින් ධීවරයින්ව ග්‍රහණයට හසුකර ගනිමින් ඔවුන් සපයන මසුන් සඳහා තමන්ට අභිමත පරිදි මිල පාලනය කිරීමෙන් ඒ තුළින් වැඩි වාසීන් අත්කර

ගැනීමයි. මේ තත්ත්වය හේන් ගොවියා හෝ වී ගොවියා සම්බන්ධයෙන් වුවද සමානය. ග්‍රාමීය ශ්‍රී ලංකාවේ බොහොමයක් වී හා හේන් ගොවීන් එදිනෙද ජීවත්වීම සඳහාත් ගොවිතැනට අවශ්‍ය යෙදවුම් ලබාගැනීම සඳහාත් වෙළඳුන්ට ණය වන අතර, කන්නය අවසානයේ දී ලබා ගන්නා අස්වැන්නෙන් විශාල කොටසක් ලබාගත් ණය සඳහාත්, පොලී සඳහාත් හිලව් කරති. නැවතත් දරිද්‍රතාවයෙන් පෙලෙන ඔව්හු එදිනෙද ජීවත්වීම සඳහා ණය ලබා ගනිති. එනිසා එදිනෙද කටයුතුවලට ණය ගැනීම් ආදිය නිසා වී ගොවියාත් ධීවරයාත් අවසාන වශයෙන් මුහුණදෙනු ලබන්නේ සමාන වාතාවරණයකට බව පැහැදිලි වේ.

**නිගමනය**

මෙතෙක් සාකච්ඡා කළ පරිදි අධ්‍යයනයට ලක්වූ ජලාශ ප්‍රදේශවල මාළු වෙළඳාම සීමිත වූ වෙළඳුන් කීපදෙනකුගේ අධිකාරිය යටතේ පැවතීමේ හේතුවෙන් තරඟකාරී වෙළඳපොලක් නොමැති බැවින් වෙළඳුන් විසින් නොයෙකුත් උපක්‍රම අනුගමනය කර ඒ තුළින් වැඩි වාසීන් අත්කර ගන්නා බව පැහැදිලි වේ. මෙම ජලාශයන්හි ධීවර කර්මාන්තය මනාව සංවිධානය කළ වකවානුවේ සිට මේ දක්වා වූ වසර හතරක පමණ කාලසීමාව තුළදී අදල ධීවරයින් හා වෙළඳුන්ගේ ප්‍රගතිය පිළිබඳව විමර්ශනය කොට බැලුවහොත් මෙය වඩාත් පැහැදිලිවේ. මේ කාලසීමාව තුල දී ධීවරයින්ගේ ජීවන තත්ත්වයෙහි එතරම් වර්ධනයක් ඇතිවී නොමැති අතර ඔවුන්ගෙන් බොහොමයක් කලින් සිටියා සේ මැටි ගැසූ හා පොල්අතු සෙවිලිකල තාවකාලික නිවෙස්වල තවම ජීවත් වෙති. එහෙත් ඉහත දී සාකච්ඡාවට ලක්කල ලොකු වෙළඳුන් සැහෙන ප්‍රගතියක් අත්කර ගෙන තිබෙනු පෙනේ. ඔවුන්ගෙන් ඇතැම් අය අළුත් වාහන ආදිය මිලට ගෙන මසුන් වෙළඳාම ඉතා ඉහළ මට්ටමකින් කරගෙන යනු දක්නට හැක.

සාකච්ඡාවට බඳුන්කල ජලාශයන්හි ධීවර කර්මාන්තයෙහි යෙදෙන ධීවරයින්ට තමන්ගේ මාළු සඳහා හොඳ වෙළඳපල වාතාවරණයක් යටතේ දැනට වඩා ඉහළ මිලකට තම මාළු විකුණා ගැන්මට හැකිවන්නේ නම් ඔවුන්ට ඉහළ ආදායමක් ලැබෙනවා පමණක් නොව, ඒ තුලින් උසස් ජීවන මට්ටමක් ද පවත්වා ගත හැකිය. මාළු වෙළඳාම පිළිබඳව පවත්නා තත්ත්වය සතුටුදායක නොවන අතර, මිරිදිය ධීවර කර්මාන්තය තවදුරටත් දියුණු කිරීමට ද එය බාධාවක් වෙයි. එනිසා මෙය තවදුරටත් දියුණු කිරීමට හා ග්‍රාමීය ආර්ථිකයෙහි සමෘධිමත් අංශයක් බවට පත්කිරීම සඳහා මාළු වෙළඳාම පිළිබඳව පවත්නා අයහපත් තත්ත්වය නැති කිරීමට පියවර ගැනීම ඉතා වැදගත් වේ. අල්ලනු ලබන මසුන් සඳහා ආරක්ෂිත වෙළඳ පලක් ඇති කිරීම සඳහා රජය කෙලින්ම සහභාගී වීම වැදගත් වන අතර නිෂ්පාදිත ප්‍රදේශය තුලින් මසුන් එකතුකර මසුන් නොමැති ගම්බද ප්‍රදේශවලට බෙද හැරීමට හැකිවන සේ ක්‍රමවත් ක්‍රියාදමයක් ඇතිකිරීම කාලෝචිත වේ. මේ තුළින් අධික ලාභාංශයක් ලබාගන්නා අතරමැදියන් ඉවත් කිරීමට හැකිවන අතරම ධීවරයාට ද ඉහල මිලක් ලබාදෙමින් සාධාරණ හා අඩු මුදලකට පාරිභෝගිකයන්ට ඇති තරම් මාළු ලබාදීමට හැකිවේ. ග්‍රාමීය පෝෂණ තත්ත්වය පිළිබඳව පවත්නා ප්‍රශ්නය විසඳීමට ද මෙය රුකුලක් වනු නොඅනුමානය.

---

**ආශ්‍රිත ග්‍රන්ථ;**


(1) Alexender, Paul , "Malu Mudalali" Monopsonies)in Southern Sri Lanka Fish Trading Social Anaysis No. 2 November 1979, (pp. 3—17)

(2) Lawson, R.M., "New Directions in Developing Small Scale Fisheries," Teaching and Research Forum, No. 21, May 1979.

(3) Marga Institute, Colombo, Socio-Economic conditions of Small-Scale Fishermen in Sri Lanka

(4) Ministry of Fisheries, Sri Lanka, Fisheries Development strategy, November 1984.

(5) People's Bank, Colombo, Sri Lanka, "Fisheries Resources Tapped and Untapped," in Economic Review, August 1977.

(6) Stirrat, R. L. "Fish to Market: Traders in Rural Sri Lanka," South Asian Review Volume 7, November 3rd, April 1979, (pp. 189—208)